HIV/AIDS පිළිබඳව වාර්තාකරණයේදී දුර්මත ඉදිරිපත් නොකිරීම, වැරදි හෝ නොමඟ යවන සුළු තොරතුරු ලබානොදීම, ඒ සම්බන්ධ මාධ්‍ය ආචාර ධර්ම තුළ ඇති කරුණකි. මෙම ආචාර ධර්මය යටතට ගත හැකි එක් කරුණක් වන්නේ HIV සහ AIDS පටලවා නොගැනීමයි. එසේ පටලවා නොගැනීම වැදගත් වන්නේ, ඒ ඔස්සේ HIV සම්බන්ධයෙන් සමාජය තුළ පදනම් විරහිත බියක් ඇති කිරීම, සමාජය තුළ ඒ සම්බන්ධයෙන් වැරදි මත ගොඩනැංවීම සහ ඒ හේතුවෙන් HIV ආසාදනය අවම කිරීමට සිදුකෙරෙනා කටයුතු වලටද එය බාධාවක් වීම නිසායි.

කෙසේ නමුත්, දිවයින පුවත්පතේ (12/09) "කොරෝනා මැදින් ඒඩ්ස් නගී" යන සිරස්තලයෙන් යුතුව ඉදිරිපත් වූ පුවතකි. මෙහි උප-සිරස්තලයේද "මේ වසරේදී මාතර ඒඩ්ස් හැදුණු 16 දෙනෙක්" යනුවෙන් සඳහන්ව තිබිණි. කෙසේ නමුත්, පුවත් අන්තර්ගතයේ සඳහන්ව තිබෙන්නේ මෙම ලිපියේ සඳහන් වන්නේ එච්.අයි.වී ආසාදිතයින් සම්බන්ධයෙන් බවයි. එසේ නම්, දිවයින මෙම පුවත් වාර්තාව මගින් ඉහත ආචාර ධර්මය උල්ලංඝනය වී ඇත.

HIV නොහොත් 'මානව ප්‍රතිශක්ති ඌනතා වෛරසය' ආසාදනය වීම නිසා මිනිසුන්ට AIDS තත්වය ඇතිවිය හැක. වෙනත් ලෙසකින් පවසන්නේ නම්, HIV යනු වෛරසය වන අතර, AIDS යනු පෙර කී වෛරසය මඟින් ක්‍රමයෙන් ප්‍රතිශක්තිය දුර්වල කිරීම නිසා ඇති වන තත්වය ලෙසින් හඳුනාගත හැක. එනම්, ඒඩ්ස් ආසාදනය නොවන අතර, ආසාදනය වන්නේ එච්.අයි.වී. වෛරසයයි. කල් තබා HIV ආසාදනය වී ඇති බව හඳුනාගැනීම සහ වහාම වෛද්‍ය ප්‍රතිකාර වලට යොමු වීම මගින් එය පාලනය කිරීමට දැන් හැකියාව ඇති බව වෛද්‍යවරු පවසයි.

HIV/AIDS පිළිබඳව වාර්තා කිරීම වැනි කරුණු වලදී මෙම ආචාර ධර්මයන් පිළිපැදීමත්, නිවැරදි තොරතුරු ලබාදීමත්, සමාජය තුළ HIV/AIDS සම්බන්ධයෙන් දුර්මත අවම කිරීම සඳහා මාධ්‍යයට ලබාදිය හැකි දායකත්වය බවද අපි මෙසේම සටහන් කරමු.

මේ සම්බන්ධයෙන් මින් පෙර අප ඉදිරිපත් කළ පෝස්ටුවකට ප්‍රවේශය මෙතැනින්: https://www.facebook.com/.../a.23402767.../1312566075765113/

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina